## 01.1හැඳින්වීම.

වෙස් මුහුණු කියූ පමණින්ම අපගේ අවධානයට යොමු වනුයේ පියවි මුහුණ වැසෙන අයුරින් පළඳිනු ලබන කිසියම් ආකාරයේ පැළඳීමක් පිළිබඳවයි. වෙනත් මානයේ වෙනත් උත්සව සමයේ භාවිත වෙනත් මුහුණ නම් අප හා අතරත් ජනප්‍රිය ය. එමෙන්ම වෙස් මුහුණ ද අපේ සංස්කෘතියේ මහාර්ඝ දායාදයක් ලෙස වර්තමානය වන විට අප රට තුළ පමණක් නොව ලොව පුරා විදෙස් සංචාරකයන් අතරද බෙහෙවින් ජනප්‍රියව පවතී. වෙස් මුහුණු යනු මුහුණ සඳහා සරනු ලද වෙස් ගැන්වීමක් ලෙස ප්‍රකාශ කළ හැකිය. මුහුණ සඳහා වන වෙස් ගැන්වීම විවිධාකාර ය. වර්තමානය වන විට මුහුණු සඳහා වන වෙස් ගැන්වීම වඩාත් ප්‍රචලිතය. නමුත් වෙස් මුහුණෙන් ගෙනඑන වෙස් ගැන්වීම එවැනි සරල වෙස් ගැන්වීමක් නොවේ. එය වඩාත්ම සංකීර්ණ ක්‍රියාවලීන් කිහිපයක් හා සංකීර්ණ අර්ථකථනයන් ඔස්සේ පාරම්පරිකව පැවත එන්නාවූ වෙස් ගැන්වීමකි. මුහුණේ හැඟීම් තුළින් හෝ වෙස් ගැන්වීම් තුළින් නිරූපණය කළ නොහැකි වඩාත් ප්‍රබල හා ගැඹුරු අවස්ථා වෙස් මුහුණු තුළින් නිරූපණය කළ හැකිය. සැබෑ මුහුණෙන් නිරූපණය කළ නොහැකි අවස්ථා වෙස් මුහුණට හා වද්දා තිබේ. එතුළින් ස්ථාවර නිරූපණයක් ලබා ගත හැකිය.

තව දුරටත් විමර්ශනය කිරීමේ දී වෙස් මුහුණු ලෙස අර්ථ ගැන්විය හැක්කේ ජීවතීය සැබෑ ස්වභාවය සඟවා ගැනීමටත්, තමාට ආවේණික නොවූ ලක්ෂණයක් ආරෝපණය කර ගැනීමටත් ජන සමාජවල භාවිතා වූ කිසියම් මෙවලමකි. වෙස් මුහුණු කලාවේ ආරම්භය කවදා, කෙසේ, කොතැනකදී ඇතිවූවා දැයි ස්ථිර වශයෙන් ප්‍රකාශ කළ හැකි නොවෙනත් එය මිනිස් ඇදහිලි හා විශ්වාසයන්ට මෙන්ම කලාවටද සම්බන්ධ වෙමින් සියවස් ගණනාවක් පුරා මිනිස් සංස්කෘතිය තුළ වැඩි වර්ධනය වූවක් ලෙස හුවා දැක්විය හැකිය. ඒ ඒ සමාජ කොටස්, ජාතීන්ට හා පරිසර තත්ත්වයන්ට සාපේක්ෂව වෙස් මුහුණේ ස්වභාවයද විවිධාකාර වී තිබේ

ලාංකේය සමාජ සංස්කෘතිය තුළ ද දුරාතීතයේ සිටම වෙස් මුහුණු භාවිතය තිබූ බවට සාධක එමටය. අපේ සංස්කෘතියේ මහාර්ඝ දායාදයක් වන වෙස් මුහුණු පහතරට ප්‍රදේශයේ ව්‍යාප්තව පවත්නා මූලික කලා සම්ප්‍රදායකි. වෙස් මුහුණු නිර්මාණය කිරීම පාරම්පරික ශිල්පීය ක්‍රමවේදයක් යටතේ සිදුවන්නකි. එහිදී මූලික පියවර මෙසේ හඳුනාගත හැකිය.

01.වෙස් මුහුණු කෙටීම නොහොත් කැපීම.

02.වෙස් මුහුණු සිත්තම් කිරීම.

මෙකී වෙස් මුහුණු නිර්මාණය වනුයේ ඇඹුම් තවී ප්‍රධාන කොටගෙන තම ශිල්පීය දක්ෂතාවය ද ඊට හැංගෙන විලසිනි. ලාංකේය වෙස් මුහුණු කලාව පිළිබඳව කතා කිරීමේදී වෙස්

මුහුණු ශිල්පීය පරම්පරා පිළිබඳව කතා නොකරම බැරිය. එකී පරම්පරාවල් කිහිපයක් යටතෙ වර්තමානය වනවිට  වෙස් මුහුණු කලාව ප්‍රචලිත වෙමින් හා විකාශනය වෙමින් පවතී ඒ අතරිනුත් ප්‍රධාන වශයෙන් වෙස් මුහුණු කලාවේ ව්‍යාප්තියක් හා විකාශනයක් ජනිත කරනු ලැබූ අම්බලන්ගොඩ ප්‍රදේශයේ සුප්‍රකට ගුරු පරම්පරා දෙකක වෙස් මුහුණු නිර්මාණයන් පිළිබඳව මෙහිදී අධ්‍යයනය කරනු ලැබේ.

01. මහ අම්බලන්ගොඩ ටී.වයිලිව් ගුණදාස ගුරුන්නාන්සේගේ ගුරු පරම්පරාව.

02. හිරේවත්තේ ජේ.වයිලිව් ආරියපාල ගුරුන්නාන්සේගේ ගුරුපරම්පරාව.

වෙස් මුහුණු පිළිබඳව කතා කිරීමේදී එය වඩාත් සංකීර්ණ විෂය පරාසයක පිහිටි කලා සම්ප්‍රදායක් බව පැහැදිලිය. එහෙයින් අධ්‍යයනයේ පහසුව උදෙසා අධ්‍යයනයේ සීමාවක් ලෙස අම්බලන්ගොඩ ප්‍රදේශයේ ව්‍යාප්ත ඉතා සඳහන් ගුරු පරම්පරා දෙකෙහි වෙස් මුහුණු නිර්මාණයන් පිළිබඳව මෙහිදී අධ්‍යයනය කරනු ලැබේ.

අතීතයේ සිටම අම්බලන්ගොඩ ප්‍රදේශය වෙස් මුහුණු නිර්මාණය උදෙසා ප්‍රචලිතය. අම්බලන්ගොඩ ප්‍රකට වෙස් මුහුණු නිර්මාණ ශිල්පත් දෙදෙනෙකු ලෙස මහ අම්බලන්ගොඩ ටී.වයිලිව් ගුණදාස ගුරුන්නාන්සේ හා හිරේවත්තේ ජේ වයිලිව් ආරියපාල ගුරුන්නාන්සේ හඳුන්වා දිය හැකිය. මොවුන් පාරම්පරිකව එන දක්ෂ වෙස් මුහුණු නිර්මාණකරුවෙකි. දක්ෂ කෝලම් නාටක ශිල්පීන්ය. මොවුන් වඩු කර්මාන්තයේ කොතරම් දක්ෂවීද යත් ඔවුන්ට වඩුයන නාමය ලැබීමට තරම් එය හේතු සාධකයක් විය. මොවුන් කැටයම් ශිල්පයේ ද ඒ හා සමානවම දක්ෂයෝ වූහ. අම්බලන්ගොඩ වෙස් මුහුණු කලාව ඉතාමත් ප්‍රචලිත සුවිශේෂී කලා ආකෘතියක් විදහා දක්වන විශේෂිත වූ නිර්මාණයකි. මෙහිදී වෙස් මුහුණු නිර්මාණය මෙන්ම වර්ණ ගැන්වීමද වෙස් මුහුණු භාවිතයද සිදුවනුයේ කිසියම් පාරම්පරික අර්ථකථන හා හේතුසාධක කිහිපයක් මුල් කොට ගනිමිනි.

දෙවියන් හෝ යකුන් විෂයෙහි දොළඹිලි පුදා ඔවුන් සතුටුකොට තරයන්ට වන රෝදක් දුරලා සතුට සශ්‍රීකත්වය නිරෝගී බව ලබා ගැනීමේ අරමුණින් වෙස් මුහුණු නාටක ඉදිරිපත් කරන බව ප්‍රකාශකය. වෙස් මුහුණු නාටක ලෙස හැඳින්වීමේදී අපට කෝලම් හා සන්නි මුහුණු එයට අන්තර්ගත කළ හැකිය. ස්වභාවික යථා ස්වරූපයෙන් එහාට ගිය වෙස් ගැන්වීමක් උදෙසා වෙස් මුහුණු නිර්මිත බව ඉහතදී ද සඳහන් කලෙමු. වෙස් මුහුණු මිනිස් ගෙන එනුයේ කොළු විරූ චරිත හෝ අතිශයෝක්තියට නගන ලද සැබෑ චරිතයි. මෙකී චරිත එකිනෙකට විවිධය. විෂමය. මෙනිසාම වෙස් මුහුණු වල හැඩය හා වර්ණ භාවිතයද එකිනෙකට වෙනස් ය. වෙස් මුහුණේ හැඩය ප්‍රමාණයේ හෝ වර්ණයේ හෝ වෙනස් වීම හේතුකොට ගෙන තරමින්නා

තුළ ද කිසියම් වෙනසක් විපර්යාසයක් ඇති වේ. වෙස් මුහුණු වල වර්ණ හා හැඩතල තුළ පවතිනා විවිධත්වය මෙහිදී මුඛ්‍ය හේතුසාධකය බවට පත් වෙයි. පුද්ගලයා වශී කරගැනීමට තරම් එය ප්‍රබලය. වෙස් මුහුණක වර්ණ හා හැඩතල තුළින් නිරූපිත අර්ථයක් තිබේ. නිරූපිත අවස්ථාවල පවා විවිධත්වයක් ඇතිවේ. මේවා එකිනෙකට සඳහාගත හැක්කේ වෙස් මුහුණුවල වර්ණ හා හැඩතල යොදන ආකාරය හා ඒවා යෙදීමේ මුඛ්‍ය පක්ෂාවන් අධ්‍යයනය කිරීම තුළිනි. එක් එක් හැඩතල වර්ණ සංයෝජනය එයට අදාල මූලික අර්ථයක් ගොඩනගනු ලබයි. තවත් ලෙසකින් කිවහොත් වෙස් මුහුණු වලින් සිදුවනුයේ වර්ණ රේඛා හැඩතල තුළින් කිසියම් අර්ථනිරූපණයක් සිදු කිරීමයි. එ නිසා වෙස් මුහුණුවල මෙන්ම ඒවා පැළඳ දක්වන චරිතවලද එකිනෙකට වෙනස්කම් දකගත හැකිය.

සන්නි මුහුණු.

සන්නි රෝග දහඅට ගෙන එන භූත බලවේග හා එම භූතයින් ගෙන එන රෝගයට අදාළව වෙස් මුහුණුවල වර්ණ හා හැඩලතල නිරූපණය කොට තිබේ.

කෝලම් නාටක.

අතිශයෝක්තියෙන් යුත් චරිත එනම් මුදලි, ජසයා, ලෙංචිනා, හේවා මුහුණු මෙන්ම යක්ෂ, රාක්ෂ, සත්ව මුහුණු ද වර්ණ හා හැඩතල තුළින් නිරූපණය කොට තිබේ. වෙස් මුහුණු නිර්මාණයේදී යාතුකර්මයකදී නම් කිසියම් රෝගයක් හෝ එම රෝග මූලික යකුන් යක්ෂණියන්ගේ ස්වරූප එම වෙස් මුහුණෙන් නිරූපණය කරන අතර කෝලම් වැනි ජන නාටක වලදී නම් කොදන්නා චරිත නිර්මාණයටත් චරිත අතිශයෝක්තියට හැඟීමටත් වෙස් මුහුණු යොදාගනු ලැබේ. වෙස් මුහුණු කෝවිලයට අදාල වූ කැටයම් කලාවකි. පසුව කෝලම් නාටක උදෙසාද පැතිර ගිය වෙස් මුහුණු කලාව වර්ණ හා හැඩතල තුළින් පුද්ගල මනෝභාවයට ප්‍රබල බලපෑමක් කරනු ලැබූ කලා නිර්මාණයකි.

මානසික විශ්‍රාන්තිය ලබා දී මනෝ විශෝධක ප්‍රතිඵල ගෙන ඒම පිණිස වෙස් මුහුණට මූලික අවධානය යොමු වන සේ විවිධ භූමිකාවන් ඔස්සේ වෙස් මුහුණු නිර්මාණය කොට තිබේ. වෙස් මුහුණු හා පුද්ගල මනස එකිනෙකට යාවෙන සේ වෙස් මුහුණු පාරම්පරික ශිල්පීය ක්‍රමවේද යටතේ නිර්මාණය කර තිබේ. වෙස් මුහුණුවල වර්ණ හා හැඩතල තුළින් ගම්‍යමාන වන්නා වූ විවිධත්වය පුද්ගලයාගේ සිතෙහි විපර්යාසයක් ඇති කරනු ලබයි. එම විපර්යාසය පුද්ගලයාගේ මනස හා ගැටී අපේක්ෂිත ප්‍රතිඵල ජනිත කරනු ලැබේ. කෝලම් නාටක තුළ දී නම් විනෝදාස්වාදයට එහා ගිය ගැඹුරු සමාජ, සංස්කෘතික, දේශපාලනික මානයන් මේ හරහා

පුද්ගල මනසට සමීප කරලයි. මිනිස් හැසිරීම් හැඟීම් යථාර්ථකාලීනව නසු කොටගෙන තිබේ. සන්නියකුමක දී නම් සන්නි මුහුණු නිර්මාණය කොට පවතිනුයේ පුද්ගලයාගේ මනෝමූලික රෝග විෂයෙහි මුඛය වූ අනුසාරයෙනි. රාත්‍රී කාලයේ දිගෑරෙන පන්දම් ආලෝකයද ද සමග පුද්ගලයා වෙත සන්නිවේදනය කරනුයේ පුබල අත්දැකීමකි. පුද්ගලයා එයට වශීවෙයි. ඒ හා බද්ධවේ. මෙකී තත්ත්වයන්ට අදාලව එහිදී විවිධාකාරයෙන් වෙස් මුහුණේ නිරූපණ අවස්ථා ද නිර්මාණය වී තිබේ.

මෙනයින් බලන කල්හි පැහැදිලි වනුයේ වෙස් මුහුණු කලාව පුද්ගලයාගේ ඇසට වඩා මනසට කතා කරන කලාංගයක් වන බවයි. වෙස් මුහුණුවල වර්ණ හා හැඩතල මේ උදෙසා ප්‍රමුඛව බලපානු ලබයි. එකී වර්ණ හැඩතල තුළින් සංජානනය වන අර්ථාන්විත පසුබිම මෙහි දී අධ්‍යයනය කරනු ලබයි. අධ්‍යයනයේ පහසුව උදෙසා වෙස් මුහුණු කලාව වඩාත් ප්‍රචලිත අම්බලන්ගොඩ ධුත්තාවඩු හා ජුවන්වඩු පරම්පරාවල් දෙකෙහි වෙස් මුහුණු වල වර්ණ හා හැඩතල තුළින් සංජානනය වන අර්ථාන්විත පසුබිම අධ්‍යයනය කරනු ලැබේ.

වෙස් මුහුණු කලාව සම්බන්ධයෙන් ලියවී ඇති පොත පත අල්ප බැවින් කරුණු අධ්‍යයනයේ දී බොහෝ පොත පත කියවා කරුණු එක්තැන් කිරීමට සිදු විය. එමෙන්ම වෙස් මුහුණු සම්බන්ධයෙන් මෙවැනි මාතෘකාවක් යටතේ කරුණු සඳහන් නොවන හෙයින් බොහෝ කරුණු අධ්‍යයනය කිරීමට ද සිදු විය. මෙම නිබන්ධනය පරිච්ඡේද පහක් යටතේ ගොනු කොට තිබේ. පළමු පරිච්ඡේදයේ දී හැඳින්වීම, ක්‍රමවේදය හා මූලාශ්‍රයන් හඳුන්වා දෙනු ලබන අතර දෙවන පරිච්ඡේදයේ දී වෙස් මුහුණු කලාව සම්බන්ධයෙන් පැහැදිලි අවබෝධයක් ලබා දෙනු ලැබේ. එහි දී වෙස් මුහුණු යනු කුමක්ද? වෙස් මුහුණු කලාවේ ප්‍රභවය හා විකාශනය, වෙස් මුහුණු ප්‍රචලිත ප්‍රදේශ හා පරම්පරා පිළිබඳව හඳුන්වා දෙනු ලැබේ. අම්බලන්ගොඩ වෙස් මුහුණු කලාව සම්බන්ධයෙන්ද මූලික අර්ථකථනයක් මෙතුළින් ගොඩනගනු ලබයි. මූලික වෙස් මුහුණු පරම්පරා පිළිබඳවත් ඔවුන්ගේ වෙස් මුහුණු කලාවේ මූලාරම්භය මෙන්ම අද වන විට එහි පවත්නා තත්ත්වයද මෙතුළින් කතා කෙරේ.

තෙවන පරිච්ඡේදයේ දී ධුත්තාවඩු හා ජුවන්වඩු පරම්පරා දෙකෙහි වෙස් මුහුණු සම්බන්ධයෙන් මූලික අවබෝධයක් ලබාදෙනු ලැබේ. ඔවුන්ගේ වෙස් මුහුණු භාවිතය මෙන්ම වර්ණ, හැඩතල සම්බන්ධයෙන් පුළුල් ලෙස අවබෝධයක් ලබා දේ. හැඩතල නිර්මාණයේ සාම්ප්‍රදායික ක්‍රමවේදය, වර්ණ සංයෝජන ක්‍රියාවලිය මෙන්ම ඇඳුම් කට්ටි සම්බන්ධවද කරුණු පෙනහැර දක්වනු ලැබේ. අද්‍යතනය වන විට වර්ණ, හැඩතල සිදුන් වී ඇති වෙනස්කම් පිළිබඳව

ද පුරල් ලෙස කරුණු දක්වේ. සිව්වන පරිච්ඡේදයේ දී වෙස් මුහුණු වර්ණ, හැඩතල භාවිතය තුළින් සංජානනය වන්නා වූ අර්ථාන්විත පසුබිම පිළිබඳව සහේතුකව කරුණු ගෙනහැර දක්වනු ලැබේ. එහිදී විශේෂඥවාදයට එහා ගිය වෙස් මුහුණේ අර්ථයන් සාකච්ඡා කෙරේ. වර්ණ, හැඩතල තුළින් නිරූපණය කරනුයේ කුමනාකාරයේ අර්ථයන්දැයි හඳුන්වා දෙනු ලැබේ.

පස්වන පරිච්ඡේදයේ දී සමස්ත අධ්‍යයනය පිළිබඳව සමාලෝචනයක් මෙන්ම එකී අධ්‍යයනයට අදාළ නිගමන හා යෝජනා ද හඳුන්වාදෙනු ලැබේ. අවසාන වශයෙන් පර්යේෂණයේ අවශ්‍යතාවය මත උපග්‍රන්ථයක් ද ඡායාරූප ඛණ්ඩයක්ද ඉදිරිපත් කරනු ලැබේ.

මේ ආකාරයෙන් මෙකී පර්යේෂණ නිබන්ධනය සමන්විත වන අතර අවසානයේ දී අම්බලන්ගොඩ පුන්කාවඩු හා පුවක්වඩු ගුරු පරම්පරා දෙකෙහි වෙස් මුහුණු තුළ අන්තර්ගත වර්ණ හා හැඩතල භාවිතය තුළින් කිසියම් ආකාරයේ අර්ථාන්විත පසුබිමක් සංජානනය වන බව සහේතුකව සනාථ කරනු ලැබේ.